සන්නස SANNASA

# මම සටන්කාමියෙකුද? ත්‍රස්තවාදියෙකුද?

සන්නසට සකස් කරන්නේ - ශ්‍රීලාල් සෙනෙවිරත්න




2009 වසරේ මැයි මස 20 වන දින දහවල් මධ්‍යාහ්නය පසුවූ මොහොතක මට එළියට එන ලෙස අණ ලැබිණ. පෙර දින රාත්‍රියෙහි මා මෙහි නතර කර ගිය සී.අයි.ඩී. නිලධාරින්ගෙන් අයෙක් පැමිණ සිටියේය. ඔහු මගේ විස්තර පත්‍රිකාවක සටහන් කර ගත්තේය. ඔහුගේ හැසිරීම ඉතාමත් විනීත සහ ආචාරශීලී විය. තවත් ස්වල්ප වේලාවකින් මා කොළඹට කැඳවාගෙන යාමට නියමිත බවත්, එයට සූදානම් වන ලෙසත් ඔහු මට දැන්වීය. මම එහි සිටි අයගෙන් ප්ලාස්ටික් බෝතලයක් ඉල්ලා ගෙන වතුර පුරවා ගත්තෙමි. සවස පැජරෝ වර්ගයේ වාහනයකට නැංවීය. එය පෙර දින රාත්‍රියේ ගිය ස්ථානයට නැවතත් ගියේය. ටික වේලාවකින් වන්නි දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රී කණකරත්නම් මහතා ද එම වාහනයට නංවා ගත්තේය. ඔහුගේ මුහුණ වියළී වෙහෙසට පත් ස්වාභාවයකින් යුක්ත විය. එම පරිසරය තුළ කිසිවක් ප්‍රකාශ කිරීමට සිත් නොවූ හෙයින් දෙදෙනාම නිහඬතාව රැක්කෙමු.

වාහනය කොළඹ බලා ධාවනය වන්නට විය. ඊළඟට සිදුවීමට නියමිත ප්‍රශ්න කිරීම් ගැන සිතත්දී සිත ගැහෙන්නට විය. අනවශ්‍ය ලෙසින් මනස කැළඹීමට පත් කර නොගෙන හිත ඒකාග්‍රතාවයට පත් කර ගැනීම සඳහා සියලු උත්සාහයන් දැරිය යුතු බවට සිතා ගත්තෙමි. පාසල් කාලයේ සිට ධයානයෙහි පැවැති මගේ උනන්දුව ඇත්තෙන්ම එම අර්බුධකාරී කාලයෙහි දී මට කොයිතරම් ප්‍රයෝජනවත් වී ද යන්න දැන් මම සිතමි. වෙඩි හඬ නොඇසෙන වර්ගයේ අර්බුධයකට මම ගමන් කරමින් සිටින බව මම හොඳින්ම තේරුම් ගත්තෙමි. මධ්‍යම රාත්‍රියට ආසන්න මොහොතක අපව රැගෙන ගිය වාහනය කොළඹ විශාල ගොඩනැඟිල්ලක් වූ හතර වෙනි තට්ටුවට ළඟා විය.

"විශේෂ විමර්ශන අංශය" යන නාම පුවරුව දුටු වහාම මගේ ඇඟ සීතල වී ගල් ගැසී ගියේය. හතර වන තට්ටුව පිළිබඳව මහත් බියකරු කතා මම සංවිධානයෙහි සිටින විට අසා ඇත්තෙමි. මගේ අත්, පාවල මුළු නියපොතුම ගලවනු ඇතැයි ද හිස බිමට එල්ලී තිබෙන ලෙසින් එල්ලා තබනු ඇතැයි ද සිතෙන විට හිස කරකැවී ක්ලාන්තය ඇති වෙන්නා සේ විය. මා කැඳවා ගෙන ගිය නිලධාරීහු සී.අයි.ඩී.යේ ඉහළ තනතුරු දරන අය බව මට තේරුම් ගියේය. එහි රාත්‍රී සේවයෙහි නිරතව සිටි සී.අයි.ඩී.යේ කාන්තා නිලධාරිනීන් වෙත මා බාර දුන්නේය. ඔවුහු මා සම්පූර්ණ ශරීර පරීක්ෂාවකට ලක් කිරීමෙන් පසුව එහි වූ කුඩා යකඩ කූඩුවක් තුළට දමා එළියෙන් අගුළු දැමූහ. පසෙකින් තවත් එවැනි සිර කුටි තිබුණි. ඒවායේ වූ කාන්තාවෝ නින්ද කැඩී ඇස් ඇර බලනු මම දුටුවෙමි. මා සමඟ ඔවන් කිසිවක් කතා නොකළ යුතුය යන අවවාදය ඔවුනට දැඩි ලෙසින් ලැබිණි.

පසු දින උදේ එහි වූ රැඳවියෝ දිය නා පිරිසිදු වූහ. දිගු දින කීපයකට පසුව මම හිස ස්නානය කළෙමි. මගේ කෙස් වැටියේ තිබූ මුල්ලිවෙයික්කාල් පස් ද, දූවිල්ල ද කාල වර්ණයෙන් දිය වී යන්නට විය. එදින උදේ නවයට පමණ ප්‍රශ්න කිරීම සඳහා මා කැඳෙව්වේය. නිලධාරීන් කණ්ඩායමක් පළමුව මගෙන් ප්‍රශ්න කළහ. සිංහල වචනයක්වත් නොදන්නා බැවින් භාෂා පරිවර්ථකයෙකුගේ උපකාරයෙන් මගෙන් ප්‍රශ්න කිරීම සිදුවිය. මගේ උපතේ සිට සංවිධානයට බැඳී එයින් ඉවත් වන තෙක් තොරතුරු ප්‍රශ්න කිරීම්වලදී සටහන් කෙරුණි.

මා රඳවා සිටි කොටසේම ත්‍රස්තවාදය මර්ධනය කිරීමේ අංශය විසින් අත්අඩංගුවට ගනු ලැබ සිටි තවත් කාන්තාවන් ද රඳවා තබා තිබුණි. පසුව ඔවුන් බූස්ස රැදවුම් කඳවුරට රැගෙන ගියහ. බූස්ස රැදවුම් කදවුරේ සිටි බොහෝ කාන්තාවන් කොළඹ පිහිටි ත්‍රස්තවාදය මර්ධනය කිරීමේ අංශයට රැගෙන විත් ඔවුන්ව වැලිකඩ හිර ගෙදරට යැවූහ. සංවිධානයෙහි සිටි සාමාජික සාමාජිකාවෝ සිය ගණනක් වැඩිදුර ප්‍රශ්න කිරීම සඳහා කොළඹ පිහිටි ත්‍රස්තවාදය මර්ධනය කිරීමේ අංශයට රැගෙන එන ලදුව ඔවන් වැලිකඩ සිරගෙදරට යවන ලදි. කිසියම් මාතෘකාවක් යටතේ මගෙන් දිනපතාම ප්‍රශ්න කිරීම් සිදුවිය. ප්‍රශ්න කිරීම්වලදී තමන්ට පහර දුන් බව සමහර කාන්තාවෝ පැවසුව ද එවැනි කිසිම ශාරීරික ප්‍රහාරයකට මගේ ප්‍රශ්න කිරීම් අවසන් වන තෙක් මා ලක්වූයේ නැත.

ජාත්‍යන්තර රතු කුරුස සංවිධානයේ නියෝජිතයෝ මාසයකට වරක් එහි පැමිණ සිරකරුවන් හමුවූහ. ඔවුහු අත්‍යාවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය ද බෙදා දුන්හ. නිවෙස්වල අය සමඟ සම්බන්ධතාවක් නොමැතිව සිටි මා වැනි අයට එම උපකාර මහත් වරප්‍රසාදයක් විය. ඔවුහු අපට ලියාපදිංචි කාඩ් පතක් ලබාදී සිරගෙයි සිට නැවත නිදහස් වන තෙක් එය තමන් සතුව තබා ගන්නා මෙන් පැවසූහ.

සී.අයි.ඩී.ය විසින් මා අධිකරණ වෛද්‍ය පරීක්ෂණයකට ලක් කරන ලදි. මගේ වෛද්‍ය පරීක්ෂණය සිදු කළ තරුණ වෛද්‍යවරිය ඇය දන්නා දෙමළ භාෂාවෙන් මා සමඟ කතා බහ කළාය. "ප්‍රාණ ඝාතනය පවක්. මේ ලෝකය කොයිතරම් ලස්සනද? ඇයි ඔයා මෙච්චර කාලයක් ත්‍රස්තවාදී සාමාජිකාවක් හැටියට හිටියේ? මින් මත්තටවත් ජීවිතවලට ආදරය කරන්න." යනාදී වශයෙන් වූ ඇයගේ අවවාද මගේ හිතට දැඩි ලෙසින් බලපෑවේය. මම සටන්කාමියෙකුද? ත්‍රස්තවාදියෙකුද? මා සටන්කාමියෙකු සහ මා ත්‍රස්තවාදියෙකු කළ මූලික කාරණය පිළිබඳව මම සිතන්නට වූවෙමි. එය දේශපාලනයයි. ආයුධවලින්ම පමණක් අපට විමුක්තිය උදාකර ගත හැකි යැයි උගන්වනු ලැබුණු දේශපාලනය විසින්ය. ආයුධ එසවූ නිසාම නුඹ ත්‍රස්තවාදියෙකුය යන ලේබලය අලවනු ලැබුවේද දේශපාලනය විසින්ය. යොවුන් වියෙහි දී මට කොයිතරම් සිහින, පැතුම්, ආශාවන් තිබුණේ ද? අනෙකුන්ගේ ජීවිතයට ආදරය කරන ළමයෙක් ලෙස මා කුඩා වියෙහි දී ඇති දැඩි විණි. මගේ ජීවිතය කැප කර ජනතාවගේ අනාගතය යහපත් කළ හැකිය යන විශ්වාසය විසින් මා අරගලයට කැඳවාගෙන යන ලදි. එහෙත් විමුක්තියේ නාමයෙන් සිදුකෙරුණු විනාශයන්ට සහ ජීවිත හානිවලට මම ද හේතුවක් ව සිටියෙමි. එය සැඟවීමට හෝ ප්‍රතික්ශේප කිරීමට හෝ උත්සාහ කිරීම මගේ හෘදය සාක්ෂියට ද්‍රෝහිවීමක් ලෙසින් මම සිතුවෙමි.

ප්‍රශ්න කිරීම සඳහා රැදවුම්කරුවෙකු ලෙසින් රඳවා ගෙන සිටි කාලය තුළදී මාසයකට වතාවක් මා විනිසුරු ඉදිරියට ගෙන ගියේය. සතියකට වරක් පවුලේ කෙනෙකුට මා බැලීමේ අවසරය ලබා දී තිබුණි. අම්මා වවුනියාවේ කුමන අවතැන්වූවන්ගේ කඳවුරෙහි සිටින්නේ ද යන්න ගැන නොදැන සිටි හෙයින් මට පනිවිඩයක් යවා අම්මා සම්බන්ධ කරගත නොහැකි විය. එබැවින් කොළඹ සී.අයි.ඩී. විමර්ශන අංශයෙහි රඳවා ගෙන සිටි සිවු මාසයක කාලය තුළ මට මගේ පවුලේ අය සමඟ කිසිම සම්බන්ධතාවක් ඇති කර ගැනීමට හැකි වූයේ නැත. පවුලේ අය ද මට සිදුවූයේ කුමක්ද? මම සිටින්නේ කොහේද? යන්න පිළිබඳව කිසිම තොරතුරක් නොදැන උන්හ. මා ඒ පිළිබඳව එහි පැමිණෙන රතු කුරුස සංවිධානයෙහි නියෝජිතයන්ට පැවසූ අවස්ථාතවේ වවුනියාවේ පිහිටි සුභ සාධන කඳවුරුවලට යෑමේ අවසරය තමන්ට තවමත් ලැබී නොමැති බව ඔවුහු පැවසූහ.

මගේ භාරවීම තමන් විමුක්ති කොටි ආධාරකරුවන් යැයි කියා ගන්නා සමහරුන්ට එකඟ විය නොහැකි කරුණක් විය හැකිය. මා සමඟ උන් වෙනත් විමුක්ති කොටි සාමාජිකයන්ව බැලීමට එන මවුපියන්ගේ මාර්ගයෙන් මා පිළිබඳව බොහෝ සාපරාධී මුසාවන් මනඃකල්පිතයන් සමඟ එක්කර ප්‍රචාරය කර ඇති බව මට දැන ගන්නට ලැබුණි. මම කෝටි ගණනක මුදල් සමඟ බාර වූ බවත්, වවුනියාවේ පිහිටි සුභසාධන මධ්‍යස්ථානයන්ට හමුදාව සමඟ ගොස් බොහෝ දෙනෙකු පාවා දුන් බවත්, කියැවෙන අවලාද පුවත් මට දැනගන්නට ලැබුණි. එවිට මම මහත් චිත්ත පීඩාවන්ට ලක් වූයෙමි.

යුද්ධයේ අවසන් අදියරේදී මිය නොගොස් ජීවතුන් අතරට පැමිණීම යන හේතුව නිසාම මගේ අය මගෙන් පළිගැනීම ආරම්භයේදී මට දරාගැනීමට ඉතාමත් අපහසු කරුණක් විය. මගේ හෘද සාක්ෂියට විරුද්ධ කිසිම කටයුත්තක මම නොයෙදුණෙමි. වෙනත් සටන්කාමියෙකු පාවා දී මා ආරක්ෂාවීමට මම උත්සාහ නොකළ බව සංවිධාන ක්‍රියාකාරිත්වයෙහි සිටි මා සමඟ කටයුතු කළ බොහෝ අයගේ චිත්ත අභ්‍යන්තරය හොඳින් දන්නා කරුණකි. එහෙත් මෙවැනි අවලාද සහ අපවාද යනු මා තරණය කළ යුතු අඩවි බව බුද්ධිමත්ව සිතා මම නිහඬව සිටියෙමි. අනෙකාගේ රත් වූ ලේවල උනුසුමෙන් හීතල දුරු කරගෙන ජීවත්වීමට උත්සාහ කරන කණ්ඩායමක් මා වැනි එළොව ගොස් මෙළොවට පැමිණි සටන්කාමී පිරිස් සම්බන්ධයෙන් කුමන අන්දමේ හංවඩුවක් ගසනු ඇතැයි යන්න මම අවබෝධ කර ගෙන උන්නෙමි.